දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033 , 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

iqjisrsmdh
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) NA/01/Recruitment/04/2025
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2026.03. 10
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

**2022** කණ්ඩායම යටතේ සිසු හෙද පුහුණුව සඳහා තෝරා ගත් සියලුම සිසු/සිසුවියන් වෙත,

**සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2025 (2022 කණ්ඩායම)**

**සුදුසුකම්ලත් අයදුම්කරුවන් සිසු හෙද පුහුණුව සඳහා හෙද විදුහල් වෙත අනුයුක්ත කිරීම.**

2025 වර්ෂයේ සිසු හෙද පුහුණු පාඨමාලාවට සිසුන් බඳවා ගැනීම සඳහා අංක 2,446 දරණ 2025.07.18 දිනැතිව නිකුත්කළ ගැසට් නිවේදනයේ විධිවිධානවලට අනුව 2022 කණ්ඩායම යටතේ සිසු හෙද පුහුණුව සඳහා තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 2918 දෙනෙකුගේ නාම ලේඛනය ඇමුණුම 01 මගින් දක්වා ඇත.

02. ඒ අනුව, පුහුණු පත්වීම් ලිපි ප්‍රදානය කිරීමේ වැඩසටහන ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2026.03.14 දින පෙ.ව. 8.30 සිට ප.ව. 12.00 දක්වා අරලියගහ මන්දිරයේ ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට කටයුතු සූදානම්කර ඇති බැවින්, **සුදුසුකම්ලත් සියලුම අයදුම්කරුවන් එදින පෙ.ව. 7.00 ට පෙර අරලියගහ මන්දිරය වෙත පැමිණිය යුතු බව දන්වමි.**

03. ඔබට අදාළ හෙද විදුහල වෙත ලියාපදිංචිය සඳහා 2026.03.19 දින පෙ.ව. 8.30ට වාර්තා කරන ලෙසත්, සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙන් අභ්‍යාසලාභියා විසින් බාගත කරගත් (Download) ඇපකරයෙහි (ඇමුණුම 02) පිටපත් 02ක් සහ ගිවිසුමෙහි(ඇමුණුම 03) පිටපත් 02ක් වන පරිදි පිටපත් 04ක් එක් අභ්‍යාසලාභියෙකු විසින් සම්පූර්ණ කර අදාළ හෙද විදුහල වෙත ලබා දීමට කටයුතු කරන ලෙසත් දන්වමි. තවද, ඔබට හිමි නිල ඇඳුම් ආකෘතිය ද (ඇමුණුම 04) සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස (Download) දන්වමි.

04. පුහුණු පත්වීම් ලිපි ප්‍රදානය කිරීමේ වැඩසටහනට සහභාගි වන සියලුම ගැහැණු ළමුන් සුදු සාරියෙන් ද පිරිමි ළමුන් අත්දිග සුදු කමිසයෙන් හා කළු දිග කලිසමෙන් පැමිණිය යුතු අතර (ඇමුණුම 05) මගින් දක්වා ඇති ආකෘතිය අනුව ඇමුණුම 01 හි සඳහන් ඔබට හිමි ආසන අංකය, ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත්ව සකස්කර ඔබගේ අනන්‍යතාව තහවුරු වන පරිදි ඇඳුමේ වම්පස ඉහළ කෙළවරේ පැළඳ සිටිය යුතුය.

05. එසේම, අරලියගහ මන්දිරයේ ප්‍රධාන ශාලාවට ඇතුළුවීමේ දී ජාතික හැඳුනුම්පත පමණක් රැගෙන ආ යුතු අතර, ගමන්මළු හා වතුර බෝතල් රැගෙන ඒමෙන් වළකින ලෙසත් දන්වමි.

ජී.ඩබ්.සී. සුමේධා ප්‍රියභාෂිණී
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය" කොළඹ 10.

ජී.ඩබ්.සී. සුමේධා ප්‍රියභාෂිණී
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II

අත් කළේ/
වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය